**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2014**

-----------------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා රේගුවේ අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ, ආදායම් සහ වියදම් ගිණුමේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය ව්‍යාචනය**

------------------

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලට අයත් ආදායම් හා වියදම් රු.6,240,000 ක් හා රු.11,232,000 ක් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු අරමුදල් ගිණුමේ ඇතුළත්කර තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කර නොතිබීම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ රු.1,263,653,478 ක මුදල් ශේෂය රු.1,163,604,978 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ගුවන් සමාගම් 04 කින් ලැබිය යුතු එකතුව රු.1,587,000 ක් වූ අතිකාල මුදල් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සමස්ථ ණයගැති ශේෂය වූ රු.187,062,591 කින් රු. 21,728,553 ක් වෙනුවෙන් සියයට 5 ක් බොල්ණය ප්‍රතිපාදනය කර තිබුණද,මෙම ශේෂ අවුරුදු 10 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින බැවින් ප්‍රතිපාදන ප්‍රතිශතය තීරණය කිරීමේදී එම අවිනිශ්චිතතාව සැළකිල්ලට ගෙන ප්‍රමාණවත් බොල් ණය ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව රු.11,232,000 ක ආදායමක් අරමුදලේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

## 2.3 ලැබිය යුතු ගිණුම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට රු.187,062,591 ක් වූ ණයගැති ශේෂයෙන් රු.167,702,402 ක් හෙවත් සියයට 89.65 ක් ආයතන 9 කින් අයවිය යුතුව පැවතුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට චලනය නොවන වැය විෂයයන් ලෙස ඉදිරියට එන එකතුව රු.7,017,198 ක් වූ ජංගම වත්කම් හා එකතුව රු.1,730,375ක් වූ ජංගම බැරකම් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට නියැදි පදනමක් මත තෝරාගත් එකතුව රු.174,342,471 ක් වූ ණයගැති ශේෂ 30 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථන ලිපි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නෞකා නියෝජිත ආයතන 102 ක් සමඟ එළැඹ ඇති බැඳුම්කර ගිවිසුම්වලට අදාලව ලබාගෙන තිබුණු තැන්පතු, සුදුසු ආයෝජන මාර්ගවල යෙදවීමට 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

----------------------

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ අතිරික්තය රු.73,157,047 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,318,093ක් විය. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය පසුගිය වර්ෂය හා සැසඳීමේදී රු.93,475,140 කින් වර්ධනය වී තිබූ අතර ඒ සඳහා අතිකාල ආදායම සියයට 20 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 වර්ෂයේ සිට අතිකාල අරමුදලේ හා නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ පරිහරණය නොකළ මුදල් ශේෂය රු.28,007,949 සිට රු.1,724,501,472 දක්වා වර්ධනය වීමක් පෙන්නුම් කෙරුණු අතර භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම අරමුදල් සුදුසු ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා මාසයන්හිදී අපනයන අංශයේ බාහිර පරීක්ෂණ ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් සිදුකල නියැදි පරීක්ෂාවේදී බාහිර පරීක්ෂණය සඳහා නිලධාරීන් වෙත සමාන අවස්ථා ලැබෙන අයුරින් රාජකාරී පැවරීම් සිදු නොකිරීම් හේතුවෙන් නිලධාරීන්ට මාසයකට රු.32,413 සිට රු.194,000 ක් දක්වා වූ පරාසයක් තුළ බාහිර පරීක්ෂණ ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරණ ගැසට් නිවේදනය අනුව රේගු නිලධාරීන් ස්වකීය කාර්යාලයෙහි හෝ සේවා නියුක්ත ස්ථානයෙහි හෝ හැර වෙනත් කිසියම් කාර්යාලයක හෝ ස්ථානයක රාජකාරියෙහි නිරතවීම වෙනුවෙන් නැව්බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු ගෙවීමේදී මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කරනු ලැබූ පටිපාටියක් අනුව ගෙවීම් කළ යුතුය. එහෙත් 2014 වර්ෂයේ පළමු කාර්තුව තුළ පමණක් එසේ අනුමැතියකින් තොරව ගෙවා තිබූ නැව්බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු මුදල රු.15,020,515 ක් විය.

(ඈ) ශ්‍රී ලංකන් එයාර්ලයින් ගුවන් සමාගමෙන් 2011 වර්ෂයේ අවසන් මාස 4 සහ 2012 හා 2013 වර්ෂ සඳහා ලැබිය යුතු අතිකාල මුදල් වෙනුවෙන් බිල්පත් 2015 ජනවාරි හා පෙබරවාරි මාසවලදී නිකුත් කර තිබුණු අතර ඒ අනුව අරමුදලේ අතිකාල ආදායම රැස්කිරීම සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණයේ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි. තවද අතිකාල ආදායම නියමිත කාල පරිච්ඡේදයන් තුළදී අයකර ගැනීමට වගකිව යුතු පාර්ශවයන් ක්‍රියා නොකිරීම නිසා අරමුදලේ ආදායම අනවශ්‍ය ලෙස බාහිර පාර්ශවයන් අත රැඳී තිබෙන බවද නිරීක්ෂණය විය.

(ඉ) ගුවන් සමාගම් වෙතින් ලැබිය යුතු අතිකාල මුදල් වෙනුවෙන් ඉන්වොයිස් සකස් කිරීමේදී ගිණුම් අංශයේ නිලධාරියෙකු විසින් ගුවන් යානා පැමිණීම, පිටවීම පිළිබඳව විස්තර ඍජුව ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ගුවන් සමාගමෙන් ලබාගෙන තිබුණද, එම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව අධිකාරිය ලත් පුද්ගලයෙකුගේ සහතිකය හෝ රේගුවේ මැදිහත්වීමක් නිරීක්ෂණය නොවුණු අතර මෙලෙස සකස් කරන බිල්පත් නැවත පරීක්ෂා කර නොතිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

1967 සිට 1973 දක්වා කාලපරිච්ඡේදය තුළ ආයතන 75 කින් ලබාගෙන තිබුණු රු.263,500 ක් වූ මූලික තැන්පතු මුදල්, ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට පොළී වශයෙන් රු.11,434,993 ක් ලැබී තිබුණි. වර්ෂ ගණනාවක සිට මෙම මුදල් ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීම හේතුවෙන් ඉතා අඩු පොළී ආදායමක් උපයා තිබුණි. මේ සම්බන්ධයෙන් පසුගිය වර්ෂ ගණනාවක සිට අඛණ්ඩව විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණද අදාල මුදල් වෙනත් සුදුසු ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. එසේම, ආයතන 5 ක් සම්බන්ධයෙන් බැංකු පාස්පොත් අනුව ශේෂ හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂ අතර, රු.8,545 ක වෙනසක් පැවතුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

විධිමත් අනුමැතියකින් තොරව 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අතිකාල සමාලෝචන කමිටු නිර්දේශය මත නිලධාරීන්ගේ අතිකාල දීමනාව සියයට 45 කින් වැඩිකර ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල්වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 12 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 16 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනය, ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දිනට පෙර අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

i. මූල්‍ය පාලනය
ii. අතිකාල ගෙවීම් පාලනය
iii. ගිණුම්කරණය
iv. ලෙජර් ගිණුම් හා ලේඛන පවත්වාගෙන යාම